# පරිසර අමාත්‍යාංශය

# මධ්‍යම පරිසර අධිකාරිය

## CEA/AD/PROC/GEN/03/2026

**2027 වසර සඳහා සැපයුම්කරුවන් හා කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම**

මධ්‍යම පරිසර අධිකාරියේ 2027 වර්ෂය වෙනුවෙන් භාණ්ඩ, සේවා හා වැඩ සැපයීම සඳහා පිළිගත් සැපයුම්කරුවන්ගෙන් හා කොන්ත්‍රාත්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.අධිකාරියේ 2027 වර්ෂයේ මිලදී ගැනීම් සඳහා මිල ගණන් කැඳවනු ලබන්නේ එම ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන් හා කොන්ත්‍රාත්කරුවන්ගෙන් පමණි.

භාණ්ඩ, සේවා සහ වැඩ සැපයීම සඳහා වන එක් එක් උප කාණ්ඩයක් වෙනුවෙන් ආපසු නොගෙවනු ලබන රු. 2,000.00 ක ලියාපදිවි ගාස්තුවක් ගෙවිය යුතුය. මෙම ගාස්තුව මධ්‍යම පරිසර අධිකාරියේ මුදල් අයකැමී වෙත හෝ ලංකා බැංකුවේ පැලවත්ත ශාඛාවේ ගිණුම් අංක 0002937303 ට තැන්පත් කිරීම, මාර්ගගත ක්‍රමය (online Banking), Govpay පහසුකම මගින් ගෙවිය හැකිය. මුදල් තැන්පත් ලදුපතෙහි මුල් පිටපත ඔබගේ අයදුම්පත සමග ඉදිරිපත් කළ යුතුය.

සැපයුම්කරුවන් වර්ගීකරණය පිළිබඳ විස්තර, භාණ්ඩ, සේවා සහ වැඩ සඳහා අදාල අයදුම්පත් හා කොන්දේසි මධ්‍යම පරිසර අධිකාරියේ වෙබ් අඩවියේ www.cea.lk ප්‍රසම්පාදන දැන්වීම් - **සැපයුම්කරුවන් හා කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම - 2027** යටතේ 2026.10.30 දින සිට 2026.11.30 දින දක්වා බාගත කරගත හැකිය.

සම්පූර්ණ කරන ලද අයදුම්පත් ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ සහතිකය, VAT ලියාපදිංචි සහතිකය (අදාල වේ නම්), CIDA ලියාපදිංචි සහතිකය (අදාල වේ නම්) , නිෂ්පාදක අයිතය තහවුරු කිරීමේ ලිපිය (MA) (අදාල වේ නම්) සහ ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ සහතිකය (අදාල වේ නම්) යන සහතිකවල පිටපත් සමග 2027.11.30 **දින හෝ ඊට පූර්ව** පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ ගෙනැවිත් භාරදිය හැකිය. ලිපියේ ඉහල වම් කෙළවර **“සැපයුම්කරුවන් හා කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම -2027”** යනුවෙන් පැහැදිලිව සඳහන් කළ යුතුය.

ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් භාරගනු නොලබන අතර, අයදුම්පත් භාර ගැනීමේ හා ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය මධ්‍යම පරිසර අධිකාරියේ සභාපති සතුවේ.


අධ්‍යක්ෂ (පරිපාලන),
මධ්‍යම පරිසර අධිකාරිය,
පරිසර පියස,
අංක 104, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.
දුරකථන අංක 011-287278/011-2124623
www.cea.lk


**30.10.2026**